# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1849/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 14/12/2024
පැය 1240

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - කටුනායක පොලිස් වසම.

2024.12.14 වන දින අළුයම් කාලයේ කටුනායක පොලිස් වසමේ ගුවන්තොටුපල 18 කණුව මාර්ගයේ දුම්රිය හරස් මාර්ගය අසලදී ගුවන්තොටුපල දෙස සිට 18 කණුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඉදිරියෙන් එම දිසාවටම ධාවනය වූ තවත් යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබා පැදිකරුවන් දෙදෙනෙකු, පසුපැදිකරුවෙකු හා පසුපැදිකාරියක් මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකාරිය මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ පිටිපන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීර මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - තඹුත්තේගම පොලිස් වසම.

2024.12.14 වන දින අළුයම් කාලයේ තඹුත්තේගම පොලිස් වසමේ පාදෙනිය අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ බෙල්ලන්කඩවල ප්‍රදේශයේදී පාදෙනිය දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ කුඩා ලොරි රථයක් ඉදිරියෙන් ධාවනය වූ තවත් ලොරි රථයක් ඉස්සර කිරීමට යාමේදී ලොරි රථයේ බඳ කොටසේ ගැටී පෙරලී ගොස් අනතුරක් සිදු ව ඇත. අනතුරින් රියදුරන් දෙදෙනා සහ තවත් අයෙකු තුවාල ලබා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු කුඩා ලොරි රථයේ රියදුරු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ ජා ඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීම සඳහා අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගොල්ලාගම පොලිස් ස්ථානය.**

2024.12.13 වන දින සවස් කාලයේ මොරගොල්ලාගම පොලිස් වසමේ රක්වාන ප්‍රදේශයේදී මොරගොල්ලාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කෝන්වැව, මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගොල්ලාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**